# භරත නාට්‍යම්

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

## හැඳින්වීම

ප්‍රාථමික අධ්‍යාපනය හමාර කර, කණිෂ්ඨ ද්විතීයික අංශයේ 10වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලැබීමට පැමිණෙන දරුවන්ට සුදුසු පරිදි භරත නැටුම් නව විෂය නිර්දේශය සැලසුම් කර ඇත. නව අධ්‍යාපන අරමුණු හා සංකල්ප මෙහි අන්තර්ගතය.

මීට පෙර භරත නැටුම්, කර්ණාටක සංගීතය, නාට්‍ය හා රංග කලාව ආදී, කලා විෂයන් සියල්ල එකට ඉගැන්වූ අතර, 2007 වර්ෂයේ සිට 6වන ශ්‍රේණිය සඳහා මේ විෂයන් වෙන වෙනම රස වින්දනය, නිර්මාණ කුසලතා, ක්‍රියාකාරකම්, දැනුම, සංස්කෘතික පසුබිම ආදී ලක්ෂණ පසුබිම් කරගත් ඉගෙනුම් නිපුණතා යටතේ මෙම විෂය නිර්දේශය සංශෝධනය කරන ලදී.

ලෝකය නොයෙකුත් වෙනස්වීම් වලට භාජනය වේ. ඊට අනුව කලා විෂය නිර්දේශවල ද වෙනස්කම් ඇතිවීම වැළැක්විය නොහැක. ඕනෑම කලා විෂය නිර්දේශයක් අංශ 2ක් යටතේ වෙනස්කමකට භාජනය වේ.

1. විෂය කොටස් එකතුවීම - විෂය කොටස්වල වෙනස්කම් සිදු කිරීම, විෂය කරුණු පහසුවෙන් අවබෝධ කර ගැනීම.
2. විෂය කරුණු සිසුන් වෙත ළඟා කරවීම සඳහා ඉදිරිපත් කරන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන්.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල්තැන දෙන මෙම නව විෂය නිර්දේශය ශිෂ්‍යයන් හා ගුරුවරුන් එකතුව ක්‍රියාත්මක කළ යුතු බව තහවුරු කරයි. සිසුන් විෂය කරුණු සොයා ගනිමින් ඉගෙනීමට පෙළඹවීමේ ක්‍රියාකාරකම් බොහොමයකින් මෙය යුක්තය. සිසුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පැහැදිලි ව අවබෝධ කරගෙන තමා ම, කැමැත්තෙන් මෙම කටයුතු වල නියැලීමට සුදුසු පරිදි මෙම විෂය නිර්දේශය සකස් කර ඇත.

පවතින අධ්‍යාපන ක්‍රමයේ වැදගත් අවස්ථා තුනක්

1. ලබාගත් දැනුම රැකගැනීම.
2. කලින් සැලසුම් කළ විෂය කරුණු ඉගෙනීම.
3. කලින් ඉගෙනගත් විෂය කරුණු නැවත ගොඩනගා ගැනීම.

මෙහි ඇති ක්‍රියාකාරකම් සිසුන් ඉගෙනගත් දේ වෙනසකට භාජනය කර, නව මුහුණුවරකින් නව සමාජයක් ගොඩනැඟීමට උත්සාහ දරයි. මේ සඳහා තරුණ සමාජය දැනුවත් කිරීම අවශ්‍යයි. සොයාගැනීම්වල නියැලී, කලින් දැන සිටි දේ වෙනස්කර, මේ තාක් නොදැන සිටි දේ සොයා ඉගෙනීමට හුරු කිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණයි.

පහසුවෙන් ජීවිකාව කරගෙන යාමට අවශ්‍ය කුසලතා හා දක්ෂතා වලින් පිරිපුන් යහපත් පෞරුෂයක් සඳහා අවශ්‍ය චින්තන හැකියාවන් (Thinking skills) සමාජ හැකියා (Social skills ) ස්වයං හැකියා (Personal skills) ආදිය වර්ධනය කිරීමේ අරමුණින් පාසල් කාලය තුල ලබාදීමට බලාපොරොත්තුවන නව විෂය නිර්දේශයක් ලෙස මෙය හඳුන්වා දිය හැක.

ගැටළුවකට මුහුණදීමේ දී පෙර සූදානමක් ඇති කටයුතු කිරීමට හුරු කිරීම ඉතා ම අවශ්‍යයි. එබැවින් හෙට දින ලෝකය ජයගැනීමේ ඉලක්කය ඇතිව මෙම නව විෂය නිර්දේශය සකස් කර ඇත. මනා පෞරුෂයකින් හෙබි යහපත් පුරවැසියන් බිහිකිරීම මෙම විෂය නිර්දේශයේ අරමුණයි.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## විෂය අරමුණු

- හරත නැටුම් සම්බන්ධ විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් දැනුම ආකල්ප හා කුසලතා ඇති කර ගනියි.
- නර්තන කලාකරුවෙක් වීමට අවශ්‍ය පෞරුෂයක් ගොඩනඟා ගනියි.
- නිර්මාණාත්මක හැකියාවන් දියුණු කර ගනියි.
- විවිධ වූ දේශීය කලා අධ්‍යයනය කර ඇගයීමට ලක් කරයි.
- සෞන්දර්යාත්මකව රස වින්දනය කරයි.
- කලාකරුවන් ඇගයීමේ ආකල්ප දියුණු කර ගනියි.
- සම්ප්‍රදායන් හා සංස්කෘතිය රැක ගැනීමේ ආකල්ප දියුණු කර ගනියි.
- තම හැකියාවන් අවබෝධ කරගෙන ප්‍රාසාංගික කලාවන් ඉදිරිපත් කිරීමේ කුසලතාවය ලබයි.
- ජන සන්නිවේදන කුසලතාවය ලබයි.
- ස්වයං ලෙස ඉදිරිපත් වී කැපවීමෙන් කටයුතු කිරීමේ කුසලතාවය ලබයි.
- ස්වාභාවික පරිසරය රස වින්දනය කර ප්‍රකාශ කිරීමේ කුසලතාවය ලබයි.
- නව තාක්ෂණික උපකරණ භාවිතා කිරීමේ කුසලතාවය ලබයි.
- එදිනෙදා ජීවිතය සඳහා අවශ්‍ය මූලික අභ්‍යාස කරයි.
- ශිල්ප ක්‍රම අනුගමනය කරමින් නව නිර්මාණ ඉදිරිපත් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීමේ කුසලතාවය ලබයි.
- විවිධ සංස්කෘතියන්ට අයත් සමාජයක් තුළ මානව සම්බන්ධතා මනා ලෙස ගොඩ නඟයි.
- සමාජයීය පිළිගැනීම හා ප්‍රශංසාවට ලක්වෙයි.
- කලාවේ ඇති සියුම් දේවල් අධ්‍යයනය කර විස්තර කිරීමේ හා විමර්ශනය කිරීමේ කුසලතාවය ලබයි.
- කලාව පිළිබඳ සොයා ගැනීම් කර ඒවා නවතාවයකින් ඉදිරිපත් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01. ස්වභාවික පරිසරය ද, ශ්‍රී ලාංකීය දකුණු ඉන්දීය ශාස්ත්‍රීය හා ග්‍රාමීය නර්තනය ද බලා විමර්ශනය කරමින් රස විඳියි. | 1.1 භරත නර්තන සම්ප්‍රදායේ වාද්‍ය භාණ්ඩ හඳුනාගෙන විමර්ශනය කරමින් රසවිඳියි. | • මිරුදංගම්<br>• වයලින්<br>• වීණාව<br>• සෘති<br>• තාලම්<br>• බටනලාව | • භරත නර්තනයට අදාළ විශිෂ්ඨ වූ පසුතල වාදනයන් දැන ගනියි.<br>•ඒවායේ සංගීතය විමර්ශනය කරමින් රස විඳියි. | 02 |
| | 1.2 සිසුන් දැක ඇති රැකියා ආශ්‍රිත නර්තන විමර්ශනය කරමින් රසවිඳියි. | • ගොයම් කපන නර්තන<br>• ධීවර නර්තන<br>• තේ දළු නෙලන නර්තන | • ගොයම් කපන නර්තනය, ධීවර නර්තන, තේ දලු නෙලන නර්තන විමර්ශනය කරමින් රස විඳියි. | 03 |
| | 1.3 බාහිරව දැක ඇති කලාත්මක නර්තන අවස්ථා විමර්ශනය කරමින් රසවිඳියි. | • රූපවාහිනී දර්ශන<br>• සජීවී ව දැක ඇති දර්ශන<br>• C D මගින් දැක ඇති දර්ශන | • තමා නරඹන ලද වැඩසටහන් විමර්ශනය කරමින් රස විඳියි. | 02 |
| 02. ස්වභාවික පරිසරයේ තමා දැක රස වින්ද විවධ ගීත හා කෝර්සවෙ ගයමින් අභිරූපනය කරයි. | 2.1 මනඃකල්පිත මාතෘකාවකට අදාළ ව අංගචලන ඉදිරිපත් කරයි. | මනඃකල්පිත දර්ශන<br>• මල්වත්තක ලස්සන මල් පිපිලා ඇත.<br>• බඹරුන් පැණි බී මත් වෙලා ය.<br>• කුරුල්ලන් පියාපත් සලා පියාඹති | • මාතෘකාවට අදාළ මුද්‍රා නිවැරදිව යොදා ගනියි.<br>• මාතෘකාවට අදාළ සංචාර භාව ඉදිරිපත් කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 කෝර්වෙකල් නිර්මාණය කර ඉදිරිපත් කරයි. | • ආවර්තනයක ආදි තාලයට කෝර්වෙ නිර්මාණය කරයි.<br>• රූපක තාලයට ආවර්තන දෙකට කෝර්වෙ නිර්මාණය කරයි. | • ආදි රූපක තාලවලට තමාම කෝර්වෙ නිර්මාණය කරයි.<br>• නිර්මාණය කරන ලද කෝර්වෙ නියමාකාරයට ඉදිරිපත් කරයි. | 04 |
| | 2.3 තම පරිසරය කේන්ද්‍රකරගත් ග්‍රාමීය නර්තනයට අභිරූපන නිර්මාණය කර ඉදිරිපත් කරයි. | • රැකියා ආශ්‍රිත නර්තන (ස්වභාවික පරිසරය කේන්ද්‍රකරගත්) | • රැකියා කේන්ද්‍ර කරගත් නර්තන හඳුනා ගනියි.<br>• ගැමි නර්තන ගැමි තාලයටම අභිරූපනය කරයි. | 03 |
| 03. භරත නර්තන සම්ප්‍රදායට අදාළ ප්‍රාථමික පේශි ක්‍රියාකාරකම්, භරත නර්තන සම්ප්‍රදායේ මූලික අඩව්, අංග චලන විධි, දේව, නවග්‍රහ, පාන්දව්‍ය, දසාවදාර, ජාති හස්තංග නර්තන ක්‍රම අභිරූපනය කරයි. | 3.1 භරත නර්තන සම්ප්‍රදායේ මූලික අඩව්, උරුප්පඩි වරිසෙහි පළමු උරුප්පඩි වරිසෙ අභිරූපන කරයි. | •කිටතක තරිකිට දොම්<br>•තිත් තෙයින්ද තාතෙයි (1-3)<br>• මෙයියඩවු<br>• තෙයි තෙයි තතා (1 - 2)<br>• තෙයි තෙයි තාම් | • කිට තක තරිකිට දොම් මහුඩ අඩව් ආදිය අධ්‍යයනය කරයි.<br>• කිටකත තරිකිට දොම්, තිත් තෙයින්ද තාතෙයි, මෙයියඩවු, තෙයි තෙයි තකා, තෙයි තෙයි තාම් අඩවු අභිරූපනය කරයි.<br>• මේවා සියල්ලම නිර්මාණය වී ඇති තාලය ඉදිරිපත් කරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 භරත නර්තන සම්ප්‍රදායේ උරුප්පඩි අභිරූපනය කරයි. | •අලාරිප්පු<br>• ජදීස්වරම් - සාවේරි හෝ ආරපි තීර්මානම් - පළමු හා දෙවන කෝර්වෙ | • අලාරිප්පු පසු කොටස අභිරූපනය කරයි.<br>එහි තාලය ඉදිරිපත් කරයි.<br>ජතීස්වරම් | 20 |
| | 3.3 භරත නාට්‍ය හස්තංග හා විනියෝග අභිරූපනය කරයි. | • දෙඅත් විනියෝග (12-24)<br>• පාන්දව්‍ය හස්තම්<br>• දසාවදාර | • ක්‍රිෂ්ණාගේ අවදාර 10 ප්‍රකාශ කරයි.<br>• 10වන අවදාරය තවමත් ඇතිවී නොමැති බව පිළිගනියි.<br>• දෙඅත් විනියෝග, පාන්දව්‍ය, දසාවදාර හස්තංග අභිරූපනය කරයි. | 08 |
| 04. දක්ෂිණ ඉන්දීය ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාය, ලාංකීය ශාස්ත්‍රීය ගැමි නර්තනයන් ආශ්‍රිත මූලික අංග හා සංකල්ප විස්තර කරයි. | 4.1 භරත නර්තන සම්ප්‍රදායට අදාළ මූලික සංකල්ප හඳුනා ගනියි. | • පාත්තිරප් පිරානන්<br>• පහිප්පිරානන්<br>• තාල 35 විස්තර කිරීම<br>• නාට්‍ය දර්මී<br>• ලෝක දර්මී | • පාත්තිර පහිප් පිරානන් හඳුනා ගනියි.<br>තාල 35ටම මූලික වන්නේ සප්ත තාල බව පිළිගනියි.<br>• නාට්‍ය දර්මී නාට්‍ය ස්වරූපය ලෙසද, ලෝක දර්මී ලෝක ස්වරූපය ලෙසද, වන බව උදාහරණ සහිතව පැහැදිලි කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 භරත නර්තන සම්ප්‍රදායේ අඩව් හා උරුප්පඩිවල තාල අංග සලකුණු , හඳුනාගෙන ප්‍රකාශ කරයි. | තාල අංග සලකුණු විස්තර කිරීම<br>• අලාරිප්පු<br>• තෙයි තෙයි තාම්<br>• තෙයි තෙයි තතා<br>• තිත් තෙයින්ද තානෙයි<br>• කිටතක තරිකිට දොම්<br>• ජදීෂ්වර තීර්මානම් | • අලාරිප්පු, තෙයි තෙයි තාම්, තෙයි තෙයි තාතා, තිත් තෙයින්ද තා තෙයි, කිටතක තරිකිට දොම් නැමැති අඩව් ද, ජතීස්වරම් තීර්මානම් පළමුවන හා දෙවන කෝර්වෛද තාල අංග සංකේත සහිතව ලියා දක්වයි.<br>• අවදාරම් කුමක්ද යන්න පැහැදිලි කරයි.<br>• අවදාරම් ඇතිවීමේ හේතුව ප්‍රකාශ කරයි. | 10 |
| | 4.3 භරත නර්තන සම්ප්‍රදායට අදාළ උරුප්පඩිහි ලක්ෂණම්, හඳුනාගෙන ප්‍රකාශ කරයි. | | • ජදීස්වර හි ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරයි.<br>• තවිල්, උඩුක්කු, සල්ලාරි යන වාද්‍ය භාණ්ඩ ගැමි (දවුල) (උඩැක්කිය) (පන්තේරු) වාද්‍ය භාණ්ඩ ලෙස හඳුනයි. | 02 |
| | 4.4 ගැමි වාද්‍ය භාණ්ඩ පිළිබඳව අධ්‍යයනය කරයි. | • ජදීශ්වර ලක්ෂණ<br>ගැමි වාද්‍ය භාණ්ඩ<br>• තවිල් (දවුල)<br>• උඩැක්කිය | • ඒවායේ පාරම්පරිකභාවය හා භාවිතය පිළිබඳ ව විස්තර කරයි. | 02 |
| 05. ලාංකීය , ඉන්දීය ශාස්ත්‍රීය ග්‍රාමීය නර්තනයන් හි සංස්කෘතික ලක්ෂණ හා ඓතිහාසික පසුබිම අවබෝධ කරගනියි. | 5.1 කලාව වර්ධනය කිරීමට කැප වූ කලාකරුවන්ගේ ඓතිහාසික පසුබිම කුත්තු නිර්මාණය වීමට හේතු වූ සමාජීය තත්ත්වය හඳුනාගෙන ප්‍රකාශ කරයි. | • බන්දනෛ නල්ලූර් මීනාක්ෂි සුන්දරම් පිල්ලෛ<br>• කුත්තු නිර්මාණය වූ ආකාරය | • බන්දනෛ නල්ලූර් මීනාක්ෂි සුන්දරම් පිල්ලෛගේ ජීවිත කතාවේ ඓතිහාසික පසුබිම හඳුනා ගනියි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 ආගමික අවස්ථා හා සබැඳි සංස්කෘතික ඓතිහාසික පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි. | • තංජෙයි මහා කෝවිල<br>• සංග කාලය | • තංජෙයි කෝවිලෙහි ඓතිහාසික පසුබිමෙහි විශේෂත්වය ප්‍රකාශ කරයි.<br>• තංජෙයි කෝවිල හා කලාව අතර ඇති සම්බන්ධතාවය ප්‍රකාශ කරයි.<br>• තංජෙයි කෝවිල ඇසුරින් රාජ රාජ සෝලන් කලාවට ඉටුකළ මෙහෙය අගයයි.<br>• අතීතයේ දී කලාව වර්ධනය කිරීම සඳහා දායක වූ කලාකරුවන් ගැන විස්තර කරයි.<br>• අතීත කාලයේ පැවැති කලාවේ තත්ත්වය පිළිබඳව අගයයි. | 0 4 |
| | 5.3 ග්‍රාමීය නර්තනවල ඓතිහාසික පසුබිම හඳුනාගෙන ප්‍රකාශ කරයි. | • නාට්ටුක්කුත්තු<br>- වඩමෝඩි (උතුරු)<br>- තෙන්මෝඩි (දකුණු) | • කුත්තු දෙමළ ජනතාවගේ පාරම්පරික නාට්‍ය ස්වරූපයක් බව හඳුනා ගනියි.<br>• මේවා නැටුම්, ගැයුම්, සංවාද අනුසාරයෙන් කතාවක් ඉදිරිපත් කිරීමේ ලක්ෂණ ඇති ඒවා බව පිළිගනියි.<br>• මෙම කුත්තු තමන්ටම ආවේණිකවූවක් බව පිළිගනියි. | 0 5 |